සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2026
General Certificate of Education (Adv. Level) Examination, 2026

ව්‍යාපාර අධ්‍යයනය I
வணிகக் கல்வி I
Business Studies I

32 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
*Two hours*

**උපදෙස්:**

※ **සියලුම** ප්‍රශ්නවලට පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේම** සපයන්න.
※ **විභාග අංකය**, ඉහළින් ඇති කොටුවේ පැහැදිලිව සටහන් කරන්න.
※ ප්‍රශ්න අංක **1** සිට **30** තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා, එහි අංකය ප්‍රශ්නය ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.
※ ප්‍රශ්න අංක **31** සිට **50** තෙක් වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු අදාළ තිත් ඉරි මත ලියන්න.
※ සෑම ප්‍රශ්නයකට ම ලකුණු **දෙක** බැගින් හිමි වේ.

**විභාග අංකය :** ..........................................

**පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි.**

| I පත්‍රය සඳහා | |
|---|---|
| ප්‍රශ්න අංක | ලකුණු |
| 01 - 30 | |
| 31 - 50 | |
| එකතුව | |

| | අත්සන | සංකේත අංකය |
|---|---|---|
| 1 වන පරීක්ෂක | | |
| 2 වන පරීක්ෂක | | |
| අති. ප්‍රධාන පරීක්ෂක | | |
| ගණිත පරීක්ෂක | | |
| ප්‍රධාන පරීක්ෂක | | |

**1.** ව්‍යාපාරයක මූලික අරමුණු අතුරෙන් එකක් වනුයේ,
(1) නවෝත්පාදන වර්ධනයයි.
(2) පාරිභෝගික වටිනාකම ලබා දීමයි.
(3) තරගකාරීත්වය වර්ධනයයි.
(4) ආචාරධර්ම ප්‍රමිතීන් පවත්වා ගැනීමයි.
(5) ප්‍රජා සංවර්ධනය දිරිමත් කිරීමයි. (……)

**2.** පහත දෑ අතුරෙන් භාණ්ඩයක් හා සේවාවක් යන දෙවර්ගයටම අයත් වන්නේ කුමක් ද?
(1) කොණ්ඩය කැපීම
(2) පෙළපොත
(3) මංගත සිනමාපටය
(4) අවන්හලකදී කෑම ගැනීම
(5) පුවත්පත (……)

**3.** පාරිභෝගිකයින් තුළ පාරිසරික දැනුවත්භාවය වර්ධනය වීම හේතුවෙන් සමාගමක් සිය ඇසුරුම් උපායමාර්ගය වෙනස් කිරීමට බලපාන සාධකය කුමක් ද?
(1) තාක්ෂණික
(2) ආර්ථික
(3) දේශපාලනික
(4) නෛතික
(5) සමාජයීය (……)

**4.** ව්‍යාපාරයක වගකීම් කිහිපයක් පහත දැක්වේ.

A – නීතියට අනුකූලවීම
B – අව්‍යාජ ප්‍රචාරණය
C – සාධාරණ තරගකාරීත්වය
D – නියමිත දිනට බදු ගෙවීම
E – විනිවිදභාවය පවත්වා ගැනීම
F – පාරිභෝගික අයිතීන්ට ගරු කිරීම
G – අවදානම් කළමනාකරණය
H – දූෂණයෙන් වැළකීම

ඉහත දෑ අතුරෙන්, ව්‍යාපාරයක සදාචාරාත්මක වගකීම් පමණක් ඇතුළත් වරණය කුමක් ද?
(1) A, B, C, F, H
(2) A, B, C, F, G
(3) B, C, E, F, H
(4) B, D, E, G, H
(5) C, D, E, F, G (……)

**5.** වරලත්හිමියාගේ භාණ්ඩ විකිණීමෙහිලා නිරතවන ආයතනයක් හඳුන්වනු ලබන්නේ
(1) නිෂ්පාදන වරලත් ආයතනයක් ලෙස ය.
(2) ව්‍යාපාරික ආකෘති වරලත් ආයතනයක් ලෙස ය.
(3) නිෂ්පාදිත වරලත් ආයතනයක් ලෙස ය.
(4) පරිවර්තන වරලත් ආයතනයක් ලෙස ය.
(5) බෙදාහැරීමේ වරලත් ආයතනයක් ලෙස ය. (……)

[දෙවැනි පිටුව බලන්න.

Past Papers Wiki



**6.** පහත වගුවේ මුදල් ප්‍රතිපත්ති උපකරණ කිහිපයක් සහ ඒවායේ විස්තර දැක්වේ.

| මුදල් ප්‍රතිපත්ති උපකරණ | විස්තර |
|---|---|
| (i) එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය (OPR) | A - රජයේ සුරැකුම්පත් මිලට ගැනීම හා විකිණීම |
| (ii) විවට වෙළෙඳපොළ කටයුතු (OMOs) | B - බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පවත්වාගත යුතු අනිවාර්ය තැන්පතු ප්‍රතිශතය |
| (iii) නිත්‍ය පහසුකම් | C - තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදය |
| (iv) ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව (SRR) | D - බලපත්‍රලාභී වාණිජ බැංකුවලට ලබාදෙන ණය සහ තැන්පතු පහසුකම් |

ඉහත දී ඇති මුදල් ප්‍රතිපත්ති උපකරණ අනුපිළිවෙළ අනුව ඊට අදාළ විස්තර නිවැරදිව ගළපා ඇති වරණය කුමක් ද?

(1) B, A, C, D (2) B, A, D, C (3) C, D, A, B
(4) C, A, D, B (5) D, A, B, C (……)

**7.** ව්‍යාපාරයක ලක්ෂණ කිහිපයක් පහත වේ.

A – පිහිටුවීමේ පහසුව
B – අන්‍යෝන්‍ය නියෝජනය
C – අසීමිත වගකීම
D – සීමිත වගකීම
E – අඛණ්ඩ පැවැත්ම
F – නෛතික පුද්ගලභාවය
G – ලාභ බෙදාගැනීම
H – ව්‍යවස්ථාපිත විගණනය

ඉහත දැ අතුරෙන් සීමාසහිත පොදු සමාගමකට පමණක් අදාළ ලක්ෂණ ඇතුළත් වරණය කුමක් ද?

(1) A, B, F, G (2) A, D, F, H (3) B, D, F, G
(4) D, F, G, H (5) D, E, F, H (……)

**8.** නිෂ්පාදන ව්‍යාපාරයකට සම්බන්ධ ක්‍රියාකාරකම් කිහිපයක් පහත දැක්වේ.

A – බෙදාහැරීම
B – පුහුණුව
C – මූල්‍යය
D – ප්‍රවාහනය
E – නිෂ්පාදනය
F – අලෙවිකරණය
G – මානව සම්පත් කළමනාකරණය
H – විගණනය

ඉහත දැ අතුරෙන්, මෙම ව්‍යාපාරයේ ප්‍රධාන ශ්‍රිත පමණක් ඇතුළත් වරණය කුමක් ද?

(1) A, C, F, G (2) A, D, F, H (3) B, D, E, F
(4) C, D, E, G (5) C, E, F, G (……)

**9.** පහත වගුවෙහි ව්‍යාපාර වර්ග සහ ඒවාට අදාළ විස්තර දැක්වේ.

| ව්‍යාපාර වර්ග | විස්තර |
|---|---|
| (i) අතත්‍ය (Virtual) | A - එක් පරම්පාරවකින් අනෙක් පරම්පාරාවකට හිමිකාරිත්වය පවරයි. |
| (ii) සිල්ලර | B - සමස්ත රට පුරාම නිෂ්පාදිත අලෙවි කරයි. |
| (iii) ජාතික | C - ඩිජිටල් ආකාරයට මෙහෙයුම් සිදු කරයි. |
| (iv) පවුල් | D - අවසන් පාරිභෝගිකයින්ට සෘජුවම භාණ්ඩ බෙදා හරියි. |

ඉහත දී ඇති ව්‍යාපාර වර්ග අනුපිළිවෙළ අනුව ඊට අදාළ විස්තර නිවැරදිව ගළපා ඇති වරණය කුමක් ද?

(1) A, C, D, B (2) A, D, B, C (3) C, A, B, D
(4) C, D, B, A (5) D, C, B, A (……)

**10.** සැපයුම්කරුවෙකුට නිසැකවම මුදල් ගෙවීම සහතික කරනු ලබන ගෙවීම් ක්‍රමවේදය කුමක් ද?

(1) ධාරක චෙක්පත් (2) පසුදාතම චෙක්පත්
(3) බැංකු අණකර (4) පොරොන්දු නෝට්ටු
(5) විනිමය බිල් (……)

**11.** පහත වගුවෙහි ඩිජිටල් ගෙවීම් ක්‍රම කිහිපයක් සහ ඊට අදාළ විස්තර දැක්වේ.

| ගෙවීම් ක්‍රම | විස්තර |
|---|---|
| (i) විද්‍යුත් පසුම්බිය | A - ආසන්න ක්ෂේත්‍ර සන්නිවේදන (NFC) තාක්ෂණය පදනම් කරගත් ගෙවීම් |
| (ii) අන්තර්ජාල බැංකුකරණය | B - යාන්ත්‍රිකව කියවිය හැකි කේත භාවිතයෙන් ගෙවීම් |
| (iii) ක්ෂණික ප්‍රතිචාර (QR) තාක්ෂණය | C - ඩිජිටල් ගනුදෙනු සඳහා ඉලෙක්ට්‍රොනිකව තැන්පත් කළ වටිනාකම |
| (iv) ස්පර්ශ රහිත (Contactless) කාඩ්පත | D - මාර්ගගත වේදිකා තුළින් බැංකු සේවා සඳහා අවතීර්ණ වීම |

ඉහත දී ඇති එක් එක් ගෙවීම් ක්‍රම අනුපිළිවෙළ අනුව ඊට අදාළ විස්තරය නිවැරදිව ගළපා ඇති වරණය කුමක් ද?

(1) A, C, B, D (2) A, D, C, B (3) B, D, C, A
(4) C, D, A, B (5) C, D, B, A (......)

**12.** දායකත්ව රක්ෂණ මූලධර්මය අදාළ **නොවන්නේ**,

(1) ගිනි රක්ෂණයට ය. (2) මුහුදු රක්ෂණයට ය. (3) වාහන රක්ෂණයට ය.
(4) ජීවිත රක්ෂණයට ය. (5) සෞඛ්‍ය රක්ෂණයට ය. (......)

**13.** සන්නිවේදන ක්‍රම කිහිපයක් පහත දැක්වේ.

A – ඉන්ටර්කොම් (Intercom) B – පෞද්ගලික ලිපි
C – රැස්වීම් D – චක්‍රලේඛ
E – විද්‍යුත් තැපැල F – වැඩමුළු
G – කෙටි පණිවුඩ සේවාව (SMS) H – වීඩියෝ ඇමතුම්

ඉහත දෑ අතුරෙන්, පුද්ගලයකුගෙන් තවත් පුද්ගලයකුට සන්නිවේදනය සිදුකළ හැකි ක්‍රම පමණක් ඇතුළත් වරණය කුමක් ද?

(1) A, B, D, F, G (2) A, B, E, G, H (3) B, D, E, F, G
(4) B, E, F, G, H (5) C, D, E, F, G (......)

**14.** සංකේත, වගු සහ රූපසටහන් අන්තර්ගත වන්නේ කුමන සන්නිවේදන ක්‍රමයට ද?

(1) වාචික (2) ලිඛිත (3) දෘශ්‍ය (4) අංගචලන (5) අවාචික (......)

**15.** පහත වගුවෙහි දේශීය සමාගමක අපනයන අයිතම කිහිපයක් සහ වෙළෙඳපොළවල් දැක්වේ.

| අපනයන අයිතම | වෙළෙඳපොළ |
|---|---|
| තේ තොග | මහා බ්‍රිතාන්‍යය |
| නැවුම් මුහුදු ආහාර | ජපානය |
| කැපූ මල් | එක්සත් අරාබි එමීර් රාජ්‍යය |
| නිමි ඇඳුම් නියැදි | ඇමරිකා එක්සත් ජනපදය |

ඉහත එක් එක් අපනයන අයිතමය ඊට අනුරූපී වෙළෙඳපොළ වෙත ප්‍රවාහනය කළ හැකි නිවැරදි මාධ්‍ය දක්වා ඇති වරණය තෝරන්න.

(1) මුහුදු – ගුවන් – ගුවන් – මුහුදු (2) ගුවන් – මුහුදු – මුහුදු – ගුවන්
(3) මුහුදු – ගුවන් – ගුවන් – ගුවන් (4) මුහුදු – ගුවන් – මුහුදු – ගුවන්
(5) ගුවන් – මුහුදු – ගුවන් – මුහුදු (......)

PAST PAPERS WIKI

**16.** පහත වගුවෙහි නවීන සිල්ලර වෙළෙඳසැල්වල භාවිත කරන තාක්ෂණ කිහිපයක් සහ ඒවායේ කාර්යයන් දක්වා ඇත.

| තාක්ෂණ | කාර්යයන් |
|---|---|
| (i) රේඩියෝ සංඛ්‍යාත මගින් හඳුනාගැනීම (RFID) | A - වේගවත් සහ නිවැරදි බිල්පත් නිකුත් කළ හැකි වීම. |
| (ii) තොග කළමනාකරණ මෘදුකාංගය | B - විකුණුම් සඵලදායීතාවය වැඩිදියුණු වීම. |
| (iii) පාරිභෝගික සම්බන්ධතා කළමනාකරණ (CRM) මෘදුකාංගය | C - අයකැමියකුගේ සහාය නොමැතිව ගෙවීම. |
| (iv) ස්වයං සේවා ගෙවීම් යන්ත්‍රය | D - ටැග් කළ අයිතම ස්වයංක්‍රීයව හඳුනාගැනීම. |
| (v) ස්ථානීය අලෙවි (POS) පද්ධතිය | E - සැපයුම් දාමයේ දෘශ්‍යමානබව වැඩිදියුණු වීම. |

ඉහත දී ඇති එක් එක් තාක්ෂණයෙහි අනුපිළිවෙළ අනුව ඊට අදාළ කාර්යයන් නිවැරදිව ගළපා ඇති වරණය කුමක් ද?

(1) B, E, C, D, A (2) B, E, D, C, A (3) D, E, B, A, C
(4) D, E, B, C, A (5) E, D, A, B, C (......)

Past Papers Wiki



**17.** මුහුණුපොත හරහා පුද්ගලයින් අතර සෘජුවම භාණ්ඩ විකිණීම සහ මිල දී ගැනීම හඳුන්වනුයේ,
(1) B2B ලෙස ය. (2) B2C ලෙස ය. (3) B2G ලෙස ය.
(4) C2C ලෙස ය. (5) G2C ලෙස ය. (……)

**18.** භාණ්ඩයක් හෝ සේවාවක් ඒවායේ පාරිසරික ප්‍රතිලාභ පදනම් කරගෙන ප්‍රවර්ධනය කිරීම හඳුන්වනු ලබන්නේ,
(1) සමාජීය අලෙවිකරණය ලෙස ය. (2) හරිත අලෙවිකරණය ලෙස ය.
(3) සබඳතා අලෙවිකරණය ලෙස ය. (4) ශීඝ්‍ර ව්‍යාප්ත (Viral) අලෙවිකරණය ලෙස ය.
(5) සෘජු අලෙවිකරණය ලෙස ය. (……)

**19.** පහත දෑ අතුරෙන් ස්මාර්ට් (SMART) අරමුණ වන්නේ කුමක් ද?
(1) ඉදිරි වසර තුළ ව්‍යාපාරය පුළුල් කිරීම.
(2) ඊළඟ මාස 6 තුළදී ආන්තික වශයෙන් විකුණුම් වර්ධනය කිරීම.
(3) අනාගතයේදී සේවක පිරිවැටුම 3% කින් අඩු කිරීම.
(4) යහපත් ප්‍රතිඵලයක් ලබා ගැනීමට අනාගතයේදී ඵලදායී ලෙස වැඩ කිරීම.
(5) ඊළඟ මාස 6 තුළදී විකුණුම් 10% කින් වර්ධනය කිරීම. (……)

**20.** කෙරීගෙනයන වැඩ අවම වීමට බලපාන කර්මාන්තශාලා පිරියත කුමක් ද?
(1) ක්‍රියාවලි (2) නිෂ්පාදිත (3) කුටි
(4) ස්ථාවර (5) දෙමුහුන් (……)

**21.** පහත ප්‍රස්තාරය නිෂ්පාදිතයක සමච්ඡේදන ලක්ෂ්‍යය පෙන්නුම් කරයි.




ඉහත ප්‍රස්තාරයෙහි මුළු අලාභය විදහා දැක්වෙන නිවැරදි වරණය තෝරන්න.
(1) A + B (2) A + D (3) B + C (4) B + D (5) C + D (……)

**22.** ආයතනයක් සඳහා අවස්ථාවක් හා තර්ජනයක් නිවැරදිව දැක්වෙන වරණය කුමක් ද?
(1) ශක්තිමත් සන්නාම ප්‍රතිරූපය සහ කුසලතා සහිත සේවක හිඟය
(2) සමාජ මාධ්‍ය භාවිතය වැඩි වීම සහ සයිබර් ආරක්ෂණ අවදානම් වැඩි වීම
(3) උසස් නිෂ්පාදිත ගුණත්වය සහ පාරිභෝගික ලැදියාව
(4) අඩු සේවක පිරිවැටුම සහ ව්‍යාපාරයේ දුර්වල නායකත්වය
(5) ශක්තිමත් කණ්ඩායම් සංස්කෘතිය සහ මූල්‍යමය ස්ථාවරත්වය (……)

**23.** පහත වගුවෙහි සැපයුම් දාම කළමනාකරණයට අදාළ යෙදුම් සහ ඒවායේ විස්තර දැක්වේ.

| යෙදුම් | විස්තර |
|---|---|
| (i) නිෂ්පාදනය | A - භාණ්ඩ ලබාගැනීම සඳහා සැපයුම්කරුවන් හඳුනාගැනීම සහ තෝරාගැනීම. |
| (ii) ප්‍රසම්පාදනය | B - යෙදවුම් නිමි ද්‍රව්‍ය බවට පරිවර්තනය කිරීම. |
| (iii) JIT ක්‍රමය | C - අවශ්‍ය වේලාවට නිෂ්පාදනය සඳහා අමුද්‍රව්‍ය ලබා ගැනීම. |
| (iv) සැපයුම් මූලාශ්‍ර | D - ව්‍යාපාර මෙහෙයුම් සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය මිල දී ගැනීම. |

ඉහත දී ඇති යෙදුම් අනුපිළිවෙළ අනුව ඊට අදාළ විස්තර නිවැරදිව ගළපා ඇති වරණය කුමක් ද?
(1) A, D, C, B (2) B, A, C, D (3) B, D, C, A
(4) C, B, D, A (5) C, D, B, A (……)

[පස්වැනි පිටුව බලන්න.

**24.** පහත වගුවෙහි A සහ B සමාගම්වල මූල්‍ය දත්ත පෙන්නුම් කෙරේ.

| අයිතමය | A සමාගම | B සමාගම |
|---|---|---|
| ණයට විකුණුම් (රු.) | 2 500 000 | 3 200 000 |
| ශුද්ධ ලාභය (රු.) | 500 000 | 800 000 |
| වෙළෙඳ ණයගැතියෝ (රු.) | 200 000 | 400 000 |

**ශුද්ධ ලාභ අනුපාතය** = $\frac{\text{ශුද්ධ ලාභය}}{\text{විකුණුම්}} \times 100$

**වෙළෙඳ ණයගැති පිරිවැටුම් අනුපාතය** = $\frac{\text{ණයට විකුණුම්}}{\text{වෙළෙඳ ණයගැතියෝ}}$

ඉහත තොරතුරුවලට අනුව,
(1) A සමාගම වඩාත් ලාභදායී වුවද ණයගැති මුදල් එකතු කිරීමේ දී B සමාගමට වඩා කාර්යක්ෂමතාවය අඩු ය.
(2) B සමාගම වඩාත් ලාභදායී වුවද ණයගැති මුදල් එකතු කිරීමේ දී A සමාගමට වඩා කාර්යක්ෂමතාවය අඩු ය.
(3) A සමාගම B සමාගමට වඩා ලාභදායි මෙන්ම ණයගැති මුදල් එකතු කිරීමේ දී ද කාර්යක්ෂම ය.
(4) B සමාගම A සමාගමට වඩා ලාභදායි මෙන්ම ණයගැති මුදල් එකතු කිරීමේ දී ද කාර්යක්ෂම ය.
(5) A සමාගම වඩාත් ලාභදායී වන අතර B සමාගම ණයගැති මුදල් එකතු කිරීමේ දී වඩාත් කාර්යක්ෂම ය. (......)

**25.** මූල්‍ය සම්පාදන මූලාශ්‍ර කිහිපයක් පහත දැක්වේ.

A – සාධ්‍යකරණය
B – ව්‍යවසායක ප්‍රාග්ධනය
C – පෞද්ගලික හිමිකම්
D – උකස්කර
E – සාමාන්‍ය කොටස්
F – පොරොන්දු පත්‍ර
G – ණයකර
H – වරණීය කොටස්
I – රඳවාගත් ලාභ
J – වාණිජ පත්‍රිකා

ඉහත දෑ අතුරෙන් හිමිකම් මූල්‍ය සම්පාදන මාර්ග පමණක් ඇතුළත් වරණය කුමක් ද?
(1) A, B, C, H, J
(2) B, C, E, H, I
(3) B, C, F, H, J
(4) C, B, E, F, I
(5) C, E, F, H, I (......)

**26.** මානව සම්පත් කළමනාකරණය සම්බන්ධ යෙදුම් කිහිපයක් පහත දැක්වේ.

A – පුහුණුව
B – සංවේතන
C – කුසලතා
D – දැනුම
E – පෞරුෂත්වය
F – ප්‍රතිලාභ
G – අත්දැකීම්
H – උසස්වීම්
I – පිළිගැනීම
J – ආකල්ප

ඉහත දෑ අතුරෙන් සේවකයින්ට විශේෂ වූ ගුණාංග පමණක් ඇතුළත් වරණය කුමක් ද?
(1) A, C, D, E, I
(2) A, C, E, F, G
(3) C, D, E, G, J
(4) C, D, F, G, I
(5) D, E, H, G, J (......)

**27.** ආයතනයක ගැටුම් සම්බන්ධ සංඥා කිහිපයක් පහත දැක්වේ.

A – අඩු ඵලදායීතාව
B – පිකටිං
C – පිටමං කිරීම
D – සේවක පිරිවැටුම
E – අකුරට වැඩ කිරීම
F – වැඩ වර්ජන
G – උද්ඝෝෂණ
H – ප්‍රවාසීතාවය

ඉහත දෑ අතුරෙන් සේව්‍යයා හා සේවකයන් අතර අප්‍රකාශිත ගැටුම් ඇතිබව දැක්වෙන සංඥා පමණක් ඇතුළත් වරණය කුමක් ද?
(1) A, B, E, G
(2) A, D, E, H
(3) B, D, E, H
(4) B, E, F, G
(5) C, D, F, H (......)

**28.** කථන පහසුකම් (VoIP) පිළිබඳ ඇති පහත ප්‍රකාශ සලකන්න.

**ප්‍රකාශ A** : VoIP මගින් භාවිත කරන්නන් හට ස්ථාවර දූරකථන වෙනුවට අන්තර්ජාල පහසුකම් හරහා කථන ඇමතුම් ගැනීමට ඉඩ සැලසේ.

**ප්‍රකාශ B** : VoIP සේවාව භාවිත කළ හැක්කේ ස්ථාවර දූරකථන පද්ධති මගින් පමණක් වන අතර ජංගම උපාංගවලින් ක්‍රියාත්මක කළ නොහැක.

ඉහත ප්‍රකාශ දෙක අතුරෙන්,
(1) A පමණක් නිවැරදි වේ.
(2) B පමණක් නිවැරදි වේ.
(3) A හා B දෙකම වැරදි වේ.
(4) A හා B නිවැරදි වන අතර B මගින් A පැහැදිලි කෙරේ.
(5) A හා B නිවැරදි වන අතර A මගින් B පැහැදිලි කෙරේ. (......)

[හයවැනි පිටුව බලන්න.

**29.** වදන් සැකසුම් (Word Processing) යනු

(1) මෙහෙයුම් මෘදුකාංගයකි. (2) භාවිත මෘදුකාංගයකි. (3) උපයෝගිතා මෘදුකාංගයකි.
(4) වැඩසටහන් මෘදුකාංගයකි. (5) භාෂා මෘදුකාංගයකි. (……)

**30.** තාක්ෂණික සමාගමක් පහත තීරණවලට පැමිණ ඇත.

I – යතුරුලියන නිෂ්පාදනය නතර කිරීම.
II – ජංගම යෙදුම්වලින් (Mobile App) එකක් නව විශේෂාංග සහිතව යාවත්කාලීන කිරීම.




ඉහත තීරණ දෙක නිෂ්පාදිත ජීවන චක්‍රය තුළ අනුපිළිවෙළින් නිරූපණය කරන නිවැරදි වරණය තෝරන්න.

(1) A සහ B (2) A සහ D (3) B සහ C (4) D සහ B (5) D සහ C (……)

(2 × 30 = ලකුණු 60යි)

60

● අංක **31** සිට **40** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී **සුදුසු වචනය/වචන** යොදා හිස්තැන් පුරවන්න.

**31.** (අ) නිෂ්පාදනයේ ස්වභාවය අනුව මාර්ග ඉදිකිරීම අයත් වන්නේ ………………… අංශයට වන අතර බැංකුකරණය අයත් වන්නේ ………………… අංශයට ය.

(ආ) ව්‍යාපාරවලට මිනිස් ………………… නිර්මාණය කළ හැකි වුවද ඔවුන් හට මිනිස් ………………… නිර්මාණය කළ නොහැක.

**32.** (අ) පුද්ගලයකුගේ බැංකු පොලී ආදායම ඔහුට ලැබීමට පෙර අඩු කරනු ලබන බදු මුදල හඳුන්වන්නේ ………………… බද්ද ලෙස වන අතර ආයෝජන වත්කම් විකිණීමෙන් උපයන ලාභ මත අය කරනු ලබන බදු මුදල හඳුන්වන්නේ ………………… බද්ද ලෙස ය.

(ආ) තත්ත්ව කළමනාකරණ පද්ධති සමග සම්බන්ධ වන්නේ ISO ………………… වන අතර ISO ………………… සම්බන්ධ වන්නේ ආහාර සුරක්ෂිතතා කළමනාකරණ පද්ධතිවලට ය.

**33.** (අ) ආර්ථික ඇණවුම් ප්‍රමාණය යනු ………………… පිරිවැය සහ ………………… පිරිවැය එකිනෙක ඡේදනය වන ලක්ෂ්‍යය ය.

(ආ) අමුද්‍රව්‍ය හැසිරවීම ………………… කාර්යක්‍රම සම්පාදන (Logistic) පද්ධතියට උදාහරණයක් වන අතර නිමි භාණ්ඩ බෙදා හැරීම ………………… කාර්යක්‍රම සම්පාදන පද්ධතියට උදාහරණයක් වේ.

**34.** (අ) අනුගාමිකයන්ගේ යහපැවැත්ම කෙරෙහි ප්‍රමුඛත්වය ලබාදෙන්නේ ………………… අභිමුඛ නායකත්වය වන අතර ඉලක්ක සහ කාර්යයන් නිම කළ යුතු දිනය පිළිබඳව ප්‍රමුඛතාවය ලබා දෙන්නේ ………………… අභිමුඛ නායකත්වයයි.

(ආ) කළමනාකරුගේ විධිමත් තනතුර මත ………………… බලය ලැබෙන අතර ඔහුගේ දැනුම, කුසලතා සහ අත්දැකීම් මත ………………… බලය හිමි වේ.

**35.** (අ) කළමනාකරු වෙත සෘජුවම වාර්තා කරනු ලබන සේවක සංඛ්‍යාව ………………… ලෙස හඳුන්වන අතර එක් ආසන්නතම සුපරීක්ෂකවරයකුගෙන් පමණක් සේවකයකු සඳහා උපදෙස් ලැබීම ………………… ………………… ලෙස හැඳින්වේ.

(ආ) කළමනාකරුවකු හට සේවකයින් සමග හොඳින් වැඩ කිරීමට ඇති හැකියාව ………………… කුසලතා මගින් නියෝජනය වන අතර සංවිධානය සමස්තයක් ලෙස අවබෝධ කර ගැනීමට ඇති හැකියාව ………………… කුසලතා මගින් නියෝජනය වේ.

**36.** (අ) අලෙවිකරණයේදී, කර්මාන්තශාලාව ………………… සංකල්පයේ ආරම්භක ලක්ෂ්‍යය වන අතර වෙළෙඳපොළ ………………… සංකල්පයේ ආරම්භක ලක්ෂ්‍යය වේ.

(ආ) නිෂ්පාදකයෙක් නිමි ඇඳුම් කම්හලක් වෙත රෙදි අලෙවි කිරීම ………………… වෙළෙඳපොළ සඳහා උදාහරණයක් වන අතර නිෂ්පාදකයා විසින් අවසන් පාරිභෝගිකයා වෙත රෙදි අලෙවි කිරීම ………………… වෙළෙඳපොළ සඳහා උදාහරණයක් වේ.

[හත්වැනි පිටුව බලන්න.

**37.** (අ) නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය කෙටිකාලීන වෙළෙඳපොළ පොලී අනුපාතිකයේ ..................... සීමාව ලෙස ක්‍රියා කරන අතර නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය කෙටිකාලීන වෙළෙඳපොළ පොලී අනුපාතිකයේ .....................සීමාව ලෙස ක්‍රියාත්මක වේ.

(ආ) වසරකට වඩා අඩු කාල සීමාවකින් කල් පිරෙන රජයේ කෙටිකාලීන සුරැකුම්පත් භාණ්ඩාගාර ..................... ලෙස හඳුන්වනු ලබන අතර රජය විසින් නිකුත් කළ දිගුකාලීන ණය උපකරණ භාණ්ඩාගාර ..................... ලෙස හඳුන්වනු ලබයි.

**38.** (අ) රැකියාවේ ගැඹුර පුළුල් කිරීම රැකියා ..................... ලෙස හඳුන්වන අතර රැකියාවේ පරාසය පුළුල් කිරීම රැකියා ..................... ලෙස හඳුන්වනු ලබයි.

(ආ) රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල කළමනාකරණය කරනු ලබන්නේ ශ්‍රී ලංකාවේ ..................... දෙපාර්තමේන්තුව මගින් වන අතර සේවක අර්ථසාධක අරමුදල කළමනාකරණය කරනු ලබන්නේ ශ්‍රී ලංකා ..................... මගිනි.

**39.** (අ) ව්‍යාපාරයක නිවැරදි ස්ථානීය පිහිටීම සොයා ගැනීමට භාවිත කරන මාර්ගෝපදේශන පද්ධතිය ..................... ලෙස හඳුන්වන අතර මිනිසුන් මෙන් යාන්ත්‍රිකව තීරණ ගන්නා පරිගණක තාක්ෂණය ..................... ලෙස හැඳින්වේ.

(ආ) ගනුදෙනු සැකසුම් පද්ධතිය (TPS) මූලිකව භාවිත කරන්නේ ..................... මට්ටමේ කළමනාකරුවන් විසින් වන අතර විධායක උපකාරක පද්ධතිය (ESS) මූලිකව භාවිත කරනු ලබන්නේ ..................... මට්ටමේ කළමනාකරුවන් ය.

**40.** (අ) සංවිධානයක ව්‍යාපාර සැලසුමේ මිලකරණ හා ප්‍රවර්ධන උපායමාර්ග පෙන්නුම් කරනු ලබන්නේ එහි ..................... සැලැස්ම මගින් වන අතර අපේක්ෂිත ආදායම සහ පිරිවැය පෙන්නුම් කරන්නේ එහි .....................සැලැස්ම මගින් ය.

(ආ) වෙළෙඳ නීතිරීති සම්පාදනය කරමින් ගෝලීය වෙළෙඳාමේ නිදහස හා සාධාරණත්වය ප්‍රවර්ධනය කරනු ලබන ජාත්‍යන්තර සංවිධානය ................................. වන අතර මූල්‍ය ස්ථායීතාවය තහවුරු කර ගැනීමට තම සාමාජික රටවල් සඳහා මූල්‍ය උපකාර සපයන ජාත්‍යන්තර සංවිධානය ................................. වේ.

● අංක **41** සිට **50** තෙක් ප්‍රශ්නවලට **සුදුසු පිළිතුරු** දී ඇති හිස්තැන් මත ලියන්න.

**41.** පහත සඳහන් දෑ හි ඵලදායීතා දර්ශක ගණනය කිරීම සඳහා භාවිත කරනු ලබන සූත්‍ර ලියන්න.

(1) ශ්‍රම : .........................................

(2) යන්ත්‍ර සූත්‍ර : .........................................

(3) අමුද්‍රව්‍ය : .........................................

(4) පූර්ණ : .........................................

**42.** ව්‍යවසායකත්වය අභ්‍යන්තර ව්‍යවසායකත්වය මගින් වෙනස්වන ආකාර **දෙකක්** ලියන්න.

(1) .........................................................................................

(2) .........................................................................................

**43.** ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී විශේෂිත බැංකු මගින් ව්‍යාපාරවලට සපයනු ලබන සේවාවන් **හතරක්** ලියන්න.

(1) .........................................................................................

(2) .........................................................................................

(3) .........................................................................................

(4) .........................................................................................

[අටවැනි පිටුව බලන්න.

**44.** සාකල්‍යවාදී අලෙවිකරණයේ ප්‍රධාන අංග **හතර** නම් කරන්න.

(1) ..............................

(2) ..............................

(3) ..............................

(4) ..............................

**45.** කාර්ය නිෂ්පාදන ක්‍රමයට අදාළව පහත දක්වා ඇති මෙහෙයුම් නිර්ණායකවල හැසිරීම ඉහළ ද පහළ ද යන්න දක්වන්න.

| **නිර්ණායක** | **ඉහළ / පහළ** |
|---|---|
| (i) නිෂ්පාදන පරිමාව | .............................. |
| (ii) නිෂ්පාදිත පෙළ | .............................. |
| (iii) නිෂ්පාදන ක්‍රියාවලියේ නම්‍යශීලීත්වය | .............................. |
| (iv) නිෂ්පාදන පිරිවැය | .............................. |

**46.** ව්‍යාපාරයකට ලබාගත හැකි කෙටිකාලීන හා දිගුකාලීන ණය ප්‍රාග්ධන මූලාශ්‍ර **දෙක** බැගින් ලියන්න.

| **කෙටිකාලීන** | **දිගුකාලීන** |
|---|---|
| (1) .............................. | (1) .............................. |
| (2) .............................. | (2) .............................. |

**47.** ව්‍යාපාරයකට අනියම් සේවකයින් මගින් ඇතිවිය හැකි වාසි හා අවාසි **දෙක** බැගින් ලියන්න.

| **වාසි** | **අවාසි** |
|---|---|
| (1) .............................. | (1) .............................. |
| (2) .............................. | (2) .............................. |

**48.** තොරතුරු පද්ධතියක (IS) ප්‍රධාන මූලිකාංග **හතර** නම් කරන්න.

(1) ..............................

(2) ..............................

(3) ..............................

(4) ..............................

**49.** වෙළෙඳපොළ සමීක්ෂණය සඳහා සමාගමකට ප්‍රාථමික දත්ත එකතු කරගත හැකි ක්‍රමවේද **හතරක්** සඳහන් කරන්න.

(1) ..............................

(2) ..............................

(3) ..............................

(4) ..............................

**50.** වෙළෙඳ ගිවිසුම් සම්බන්ධ පහත දී ඇති කෙටි යෙදුම්වල සම්පූර්ණ නාමය ලියන්න.

(1) SAFTA - ..............................

(2) APTA - ..............................

(3) USMCA - ..............................

(4) ASEAN - ..............................

| |
|---|
| 40 |

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2026
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2026
General Certificate of Education (Adv. Level) Examination, 2026

ව්‍යාපාර අධ්‍යයනය II
வணிகக் கல்வி II
Business Studies II

32 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**උපදෙස්:**
※ එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න **දෙක** බැගින්වත් තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

**1.** ඩී.එම්. ෆුඩ්ස් සෞඛ්‍යාරක්ෂිතව පලතුරු යුෂ සැකසුම් කරනු ලබන දේශීය සමාගමකි. එම සමාගම දේශීය වැවිලිකරුවන්ගෙන් විවිධ පලතුරු වර්ග සපයාගනු ලබන අතර එම සැපයුම සෘතුමය තත්ත්ව අනුව රඳා පවතී. ආකර්ෂණීය ඇසුරුම්කරණයෙන් සහ පාරිභෝගික රුචියට සරිලන විටමින් අනූන රසයන් එක් කිරීම තුළින් ඩී.එම්. ෆුඩ්ස් තම නිෂ්පාදිතයන්ට අගය එකතු කරයි. සමාගමේ කළමනාකරුවන් එහි සැපයුම්කරුවන්, සුපිරි වෙළෙඳසැල් සහ සේවකයින් අතර සමීප සම්බන්ධතාවයක් පවත්වා ගනී. මේ අතර, නව පලතුරු යුෂ නිෂ්පාදකයින් වෙළෙඳපොළට ප්‍රවේශවීමත් සමග ඩී.එම්. ෆුඩ්ස් සමාගමෙහි පවතින තරගකාරීත්වය වැඩි විය.

(i) (අ) ඉහත සමාගම ඉටු කරනු ලබන මානව අවශ්‍යතා **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) ඉහත සමාගමේ නිෂ්පාදිතවල අගය එකතු කිරීම තුළින් එම සමාගමේ ලාභයට සිදුවන බලපෑම පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(ii) (අ) සුපිරි වෙළෙඳසැල්වල තම නිෂ්පාදිත අලෙවි කිරීමෙන් ඉහත සමාගමට අත්කර ගත හැකි ප්‍රතිලාභ **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ආ) ඩී.එම්. ෆුඩ්ස් සමාගම, වැවිලිකරුවන් සමග සමීප සම්බන්ධතාවයක් ගොඩනගා ගැනීමට අවශ්‍ය වන්නේ ඇයි දැයි හේතු **දෙකක්** දක්වන්න. (ලකුණු 02 යි)

(iii) (අ) ඉහත සමාගමේ අභ්‍යන්තර පාර්ශ්වකරුවන් **දෙදෙනකු** නම් කර, එම එක් එක් පාර්ශ්වය සමාගමේ කටයුතු කෙරෙහි ඇල්මක් දක්වන්නේ ඇයි දැයි හේතුව බැගින් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) ඉහත සිද්ධියේ ආසන්න පරිසරයට අයත් පාර්ශ්ව **හතරක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(iv) (අ) සෘතුමය විචිත්‍රත්වයේ ප්‍රතිඵලයක් ලෙස පලතුරු සැපයුම උච්ඡාවචනය වීම නිසා ඩී.එම්. ෆුඩ්ස් සමාගමට මුහුණදීමට සිදු වන තර්ජනයක් හා ලබාගත හැකි අවස්ථාවක් දක්වන්න. (ලකුණු 02 යි)

(ආ) සෞඛ්‍යාරක්ෂිතව තම නිෂ්පාදිත සැකසුම් කිරීම තුළින් ඩී.එම්. ෆුඩ්ස් සමාගමට අත්විය හැකි වාසි **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි))

(v) (අ) තම දේශීය වැවිලිකරුවන් වෙනුවෙන් ඩී.එම්. ෆුඩ්ස් සමාගමට ඉටු කළ හැකි වගකීම් **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) පාරිසරික තිරසරභාවය ප්‍රවර්ධනය කිරීම සඳහා ඩී.එම්. ෆුඩ්ස් සමාගමට දායක විය හැකි ආකාර **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(මුළු ලකුණු 20 යි)

**2.** ලිඛිත ගිවිසුමකින් තොරව කමල් සහ යසස් විද්‍යුත් උපකරණ නිෂ්පාදනය කිරීම සඳහා හවුල් ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. මෙම ආයතනය තම ව්‍යාපාර කටයුතු ජාත්‍යන්තර වෙළෙඳපොළ දක්වා පුළුල් කිරීමට රජයෙන් සහයෝගය ලබා ගැනීමට බලාපොරොත්තු වේ. වසර කිහිපයකට පසුව, යසස් තම ආයෝජන කොටස ආපසු ලබාගනිමින් හවුල්කාරිත්වයෙන් ඉවත් විය. ඉන්පසුව, මෙම ව්‍යාපාරය කේවල ස්වාමි ව්‍යාපාරයක් බවට පරිවර්තනය කරන ලදී. මේ අතරතුර, විද්‍යුත් උපකරණ කර්මාන්තයට ඉහළ බදු බර, දැඩි තත්ත්ව ප්‍රමිතීන් සහ ශ්‍රම පිරිවැයෙහි ඉහළ යාම වැනි විවිධ අභියෝගවලට මුහුණ දීමට සිදු විය.

(i) (අ) ඉහත ව්‍යාපාරයේ නිෂ්පාදිත ජාත්‍යන්තර වෙළෙඳපොළ දක්වා පුළුල් කිරීමට රජයෙන් ලබාගත හැකි උපකාරක සේවාවන් **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) මෙම ව්‍යාපාරයෙන් රජයට අත්වන ප්‍රතිලාභ **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

[දෙවැනි පිටුව බලන්න.

(ii) (අ) මෙම හවුල් ව්‍යාපාරයේ ලාභාලාභ කුමන පදනම මත හවුල්කරුවන් අතර බෙදාගත යුත්තේ දැයි හේතුවක් සපයමින් විස්තර කරන්න. (ලකුණු 02 යි)

(ආ) විද්‍යුත් උපකරණ කර්මාන්තයට රජය විසින් දැඩි තත්ත්ව ප්‍රමිතීන් පැනවීමෙන් පාරිභෝගිකයින්ට අත්වන වාසි **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(iii) හවුල් ව්‍යාපාරය කේවල ස්වාමි ව්‍යාපාරයක් බවට පරිවර්තනය කිරීමෙන් කමල්ට අත්වන වාසි **දෙකක්** හා අවාසි **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iv) (අ) ව්‍යාපාර නාම ආඥා පනත යටතේ කේවල ස්වාමි ව්‍යාපාරයක් ලියාපදිංචි නොකිරීමෙන් ව්‍යාපාරයට ඇතිවන අවාසි **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) කමල් තම ව්‍යාපාරය සීමිත පෞද්ගලික සමාගමක් බවට පරිවර්තනය කිරීමට අදහස් කරන්නේ නම්, සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු අත්‍යවශ්‍ය ලේඛන **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(v) (අ) කමල්ට ඔහුගේ විද්‍යුත් නිෂ්පාදිත පරිසර හිතකාමී ලෙස නිෂ්පාදනය කළ හැකි ආකාර **දෙකක්** යෝජනා කරන්න. (ලකුණු 02 යි)

(ආ) ශ්‍රම පිරිවැය වැඩිවීම තුළින් නිෂ්පාදන පිරිවැයට සිදුවන බලපෑම අවම කිරීම සඳහා කමල්ට අනුගමනය කළ හැකි උපායමාර්ග **දෙකක්** යෝජනා කරන්න. (ලකුණු 02 යි)

(මුළු ලකුණු 20 යි)

**3.** නදීෂා විසින් විසිතුරු භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා කුඩා පරිමාණ ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. ව්‍යාපාරයේ වර්ධනයත් සමග ඇය සේවකයන් පස්දෙනෙකු බඳවාගත් අතර, නිෂ්පාදන ධාරිතාවය පුළුල් කිරීමට ක්ෂුද්‍ර මූල්‍ය ණය පහසුකමක් තුළින් ස්වයංක්‍රීය යන්ත්‍රයක්ද මිල දී ගනු ලැබී ය. මේ අතරතුර, නදීෂා විසින් තම නිෂ්පාදිතවල නීතිමය ආරක්ෂාව සහතික කර ගැනීම සඳහා වෙළෙඳ ලකුණ ලියාපදිංචි කරන ලදී. එසේ ම ඇය තම ඉතුරුම්, කොටස් වෙළෙඳපොළෙහි සහ ඒකකභාරයක ආයෝජනය කරන ලදී.

(i) (අ) ව්‍යවසායකයකු ලෙස නදීෂාට ශ්‍රී ලංකාවේ ආර්ථිකයට දායක විය හැකි ආකාර **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) නදීෂාගේ මෙම ව්‍යාපාරය සුළු පරිමාණ ව්‍යාපාරයක් ලෙස වර්ග කිරීමට අදාළ වන ඉහත සිද්ධියෙහි ඇතුළත් නිර්ණායකයක් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) (අ) කොටස් වෙළෙඳපොළේ ආයෝජනය කිරීමට වඩා බැංකුවක ඉතිරි කිරීම තුළින් නදීෂාට ලබාගත හැකි වාසි **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) ක්ෂුද්‍ර මූල්‍ය ණයක් ලබා ගැනීමෙන් නදීෂාට සිදු විය හැකි අවාසි **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(iii) (අ) තම ව්‍යාපාරය පුළුල් කිරීමේදී නදීෂාට මුහුණදීමට සිදුවිය හැකි අභියෝග **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ආ) නදීෂාට ඇගේ ව්‍යාපාරය පුළුල් කිරීම සඳහා සහාය ලබාගත හැකි බැංකු හැර වෙනත් රාජ්‍ය ආයතන **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(iv) (අ) ඒකකභාරවල ආයෝජනය කිරීමෙන් නදීෂාට ලබාගත හැකි ප්‍රතිලාභ **දෙකක්** දක්වන්න. (ලකුණු 02 යි)

(ආ) තම ව්‍යාපාරය ස්වයංක්‍රීයකරණය කිරීම තුළින් නදීෂාට ලබාගත හැකි ප්‍රතිලාභ **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(v) (අ) 'වෙළඳ ලකුණ' යන්න නිර්වචනය කරන්න. (ලකුණු 02 යි)

(ආ) තම නිෂ්පාදිතවල වෙළෙඳ නාමය ලියාපදිංචි කිරීමෙන් නදීෂාට ලැබිය හැකි වාසි **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(මුළු ලකුණු 20 යි)

**4.** (i) (අ) සාමාන්‍ය රක්ෂණයෙන් ව්‍යාපාරයකට හිමිවන ප්‍රතිලාභ **දෙකක්** දක්වන්න. (ලකුණු 02 යි)

(ආ) ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාවෙන් (SLECIC) අපනයනකරුවන්ට ලබාදෙන සේවා **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) (අ) 'ක්‍රම කාර්ය සම්පාදනය (Logistics)' යන්න නිර්වචනය කරන්න. (ලකුණු 02 යි)

(ආ) ක්‍රම කාර්ය සම්පාදන කළමනාකරණයේ ප්‍රධාන කාර්යයන් **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 02 යි)

(iii) (අ) ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික වෙළෙඳ ගිවිසුම් අතර ඇති වෙනස්කම් **දෙකක්** දක්වන්න. (ලකුණු 02 යි)

(ආ) ඍජු හා වක්‍ර බෙදාහැරීම් මාර්ග අතර ඇති වෙනස්කම් **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

[තුන්වැනි පිටුව බලන්න.

Past Papers Wiki



(iv) (අ) ජාත්‍යන්තර වෙළෙඳාමේදී ප්‍රභවස්ථාන සහතිකය භාවිතයෙන් ආනයනකරුවන්ට අත්වන ප්‍රතිලාභ **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ආ) බලය නොලත් මාර්ග ඔස්සේ ජාත්‍යන්තරව මුදල් යැවීමෙන් රටකට සිදුවිය හැකි අවාසි **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(v) (අ) රටක් විසින් වෙනත් රටකට වෙළෙඳ සම්බාධක පැනවීමට හේතු **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ආ) ආනයන සීමා කිරීමට රජය විසින් පනවනු ලබන ප්‍රමාණාත්මක සහ ගුණාත්මක පාලන ක්‍රමය බැගින් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(මුළු ලකුණු 20 යි)

## II කොටස

**5.** ෆ්‍රන්ට් ලයින් ප්ලාස්ටික් බෝතල් කර්මාන්තශාලාවේ නිෂ්පාදන කළමනාකරු විසින් නාස්තිය අවම කිරීමට සහ දෛනික නිෂ්පාදන පරිමාව බෝතල් 7 500 සිට 10 000 දක්වා වැඩි කිරීමට සැලසුමක් පිළියෙල කර ඇත. කළමනාකරණය, ඉහළ සිට පහළට අඛණ්ඩ නියෝග දීමේ දාමය භාවිත කරන අතර තීරණ ගැනීමේ දී සේවක සහභාගීත්වය වර්ධනය කරලීමට උනන්දු කරවයි. කෙසේ වුවත්, දුර්වල තොග පාලන පද්ධතිය හේතුවෙන් තොග හිඟය සහ නිෂ්පාදන ප්‍රමාදයන් ඇති විය.

(i) (අ) නාස්තිය අවම කිරීම තුළින් ෆ්‍රන්ට් ලයින් ආයතනයට ලබාගත හැකි ප්‍රතිලාභ **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) ප්ලාස්ටික් බෝතල් නිසා පරිසරයට ඇති විය හැකි අහිතකර බලපෑම් **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ii) (අ) 'නියෝග දීමේ දාමය' යන්න අර්ථ දක්වන්න. (ලකුණු 02 යි)

(ආ) කළමනාකරණය විසින් යොදාගනු ලබන ඉහළ සිට පහළට නියෝග දීමේ ප්‍රවේශයේ වාසියක් සහ අවාසියක් ලියන්න. (ලකුණු 02 යි)

(iii) (අ) සහභාගිත්ව නායකත්ව ශෛලිය, සේවක අභිප්‍රේරණය සඳහා බලපාන්නේ කෙසේ දැයි පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(ආ) තීරණ ගැනීමේ දී සේවක සහභාගිත්වය උනන්දු කරලීම තුළින් ආයතනයට ඇතිවන අවාසි **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(iv) (අ) දුර්වල තොග පාලනයට හේතු **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 02 යි)

(ආ) නිෂ්පාදන ප්‍රමාදය හේතුවෙන් ෆ්‍රන්ට් ලයින් ප්ලාස්ටික් බෝතල් ව්‍යාපාරයට සිදුවන අහිතකර බලපෑම් **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(v) (අ) පවත්නා සම්පත් ධාරිතාව තුළ නිෂ්පාදන මට්ටම බෝතල් 10 000ක දක්වා ඉහළ නැංවීමට යොදාගත හැකි උපායමාර්ග **දෙකක්** යෝජනා කරන්න. (ලකුණු 02 යි)

(ආ) නිෂ්පාදනයේ දී 'නිෂ්ක්‍රිය කාලය' යනුවෙන් අදහස් කරන්නේ කුමක් දැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(මුළු ලකුණු 20 යි)

**6.** ගැමා, දේශීය ටෙලි මාකටින් (telemarketing) සමාගම ජාත්‍යන්තර ව්‍යාපාර හේතුවෙන් දැඩි තරගකාරිත්වයකට මුහුණ දී සිටියි. දිවයින පුරා තම සේවාව පුළුල් කිරීමට සමාගම ඩිජිටල් අලෙවිකරණ ප්‍රවර්ධන වැඩ සටහනක් සමාජ මාධ්‍ය හරහා සිදු කරන ලදී. එයට අමතරව, නිවෙස් වෙත තම නිෂ්පාදන බෙදාහැරීම සඳහා පරිසර හිතකාමී ඇසුරුම් හඳුන්වාදෙන ලදී. තවද, ගැමා සමාගම සේවාව කඩිනම් කිරීම සඳහා බෙදාහැරීමේ රථ මිල දී ගැනීමට වාණිජ බැංකුවකින් ණයක් හෝ ලීසිං පහසුකමක් ලබා ගැනීමට බලාපොරොත්තු වේ. මේ අතර, සමාගමේ ඉහළ මෙහෙයුම් පිරිවැය හේතුවෙන් මුදල් ප්‍රවාහ ගැටලු ඇති විය.

(i) (අ) ගැමා සමාගම භාවිත කළ අලෙවි මිශ්‍ර උපායමාර්ග **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) නිවෙස් වෙත බෙදාහැරීම තුළින් ගනුදෙනුකරුවන්ට අත්වන ප්‍රතිලාභ **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) (අ) සමාජ මාධ්‍ය අලෙවිකරණ ප්‍රවර්ධන වැඩසටහන් මගින් ගැමා සමාගමට අත්වන ප්‍රතිලාභ **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) ඩිජිටල් අලෙවිකරණ ප්‍රවර්ධන වැඩසටහන් තුළින් මෙම ව්‍යාපාරයට මුහුණ දීමට සිදුවිය හැකි අවදානම් **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

PAST PAPERS WIKI

[හතරවැනි පිටුව බලන්න.

අ.පො.ස උසස් පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

Past Papers Wiki



(iii) පරිසර හිතකාමී ඇසුරුම් මගින් සමාගමේ සන්නාම ප්‍රතිරූපය වැඩිදියුණු වන ආකාර **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iv) (අ) බෙදාහැරීමේ රථ මිල දී ගැනීම සඳහා වාණිජ බැංකුවකින් ණයක් ලබාගැනීමෙන් ගැමා සමාගමට අත්වන වාසි **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) ගැමා සමාගම කල්බදු පහසුකම් යටතේ බෙදාහැරීමේ රථ මිල දී ගන්නේ නම් මෙහෙයුම් කල්බදු පහසුකමට වඩා මූල්‍ය කල්බදු පහසුකම වඩාත් සුදුසු ඇයි දැයි හේතු **දෙකක්** දක්වන්න. (ලකුණු 02 යි)

(v) (අ) ගැමා සමාගමේ මුදල් ප්‍රවාහ ගැටලු විසඳා ගැනීමට යොදාගත හැකි උපායමාර්ග **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) තම වාහන සමූහයක් පවත්වා ගැනීමට වඩා බෙදාහැරීමේ සේවා බාහිරෙන් ලබා ගැනීමේ වාසියක් සහ අවාසියක් ලියන්න. (ලකුණු 02 යි)

(මුළු ලකුණු 20 යි)

**7.** ව්‍යාපාරයක කළමනාකරණය විසින් සේවකයින් බඳවා ගැනීම සඳහා නිල කැඳවීම් රහිත සම්මුඛ පරීක්ෂණ (walk-in interview) ක්‍රමයක් සැලසුම් කර ඇත. එමෙන් ම, සේවක අභිප්‍රේරණය සඳහා සමාගම විසින් මනාව සැලසුම් කළ පුහුණු සහ සංවර්ධන වැඩසටහනක් මෙන්ම ප්‍රතිලාභ යෝජනා ක්‍රමයක් නිර්මාණය කර ඇත. මීට අමතරව, සමාගමේ කළමනාකරණ පාලන පද්ධතිය සහ මානව සම්පත් සැලැස්ම යාවත්කාලීන කිරීමට සැලසුම් කර ඇත.

(i) (අ) නිල කැඳවීම් රහිත සම්මුඛ පරීක්ෂණවලින් ව්‍යාපාරවලට ඇති වාසි **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ආ) නිල කැඳවීම් රහිත සම්මුඛ පරීක්ෂණ හැර ඉක්මනින් සේවකයින් බඳවාගත හැකි විකල්ප ක්‍රම **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) (අ) පුහුණු හා සංවර්ධන අවස්ථා ලබා දීමෙන් සේවකයින්ට හිමිවන ප්‍රතිලාභ **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) සේවකයින් සඳහා ප්‍රදානය කළ හැකි මූල්‍යමය නොවන ප්‍රතිලාභ **දෙකක්** යෝජනා කරන්න. (ලකුණු 02 යි)

(iii) (අ) සේවක අනුප්‍රාප්තික සැලසුමකින් සමාගමකට අත්වන ප්‍රතිලාභ **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) ව්‍යාපාරයක කෙටිකාලීන හා දිගුකාලීන සැලසුම්කරණය අතර ඇති වෙනස උදාහරණයක් ඇසුරෙන් පෙන්වා දෙන්න. (ලකුණු 02 යි)

(iv) (අ) කළමනාකරණ පාලන පද්ධති යාවත්කාලීන කිරීමෙන් සමාගමට ලැබිය හැකි ප්‍රතිලාභ **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) 'කාර්යමණ්ඩල සැලැස්ම' යනු කුමක් ද? (ලකුණු 02 යි)

(v) තත්ත්ව කළමනාකරණයේ දී යොදාගනු ලබන 'ශුන්‍ය දෝෂ' (Zero defects) ශිල්පීය ක්‍රමයේ ඇති වාසි **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

**8.** (i) (අ) සෙවුම් යන්ත්‍රයක් (Search Engine) යනු කුමක් ද? (ලකුණු 02 යි)

(ආ) ව්‍යාපාරයක සයිබර් ආරක්ෂණ (Cyber security) තර්ජන වළක්වා ගත හැකි ක්‍රම **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) (අ) විවෘත (Open source) මෘදුකාංග භාවිතයෙන් ව්‍යාපාරයකට අත්වන වාසි **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ආ) පරිගණක පද්ධතියක භාවිත කරනු ලබන ආදාන උපකරණ (input devices) **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(iii) (අ) ව්‍යාපාරික තීරණ ගැනීම සඳහා විශාල දත්ත (big data) භාවිත කිරීමේ වාසි **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ආ) ස්ථානීය ප්‍රාදේශීය පරිගණක ජාල (LAN) හා පුළුල් ක්ෂේත්‍ර පරිගණක ජාල (WAN) අතර ඇති වෙනස පහදන්න. (ලකුණු 02 යි)

(iv) (අ) පවතින ව්‍යාපාර සැලැස්මක් සංශෝධනය කිරීමට සිදුවන අවස්ථා **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ආ) ව්‍යාපාර සැලසුම්කරණයේ දී මූල්‍ය පුරෝකථනවල ඇති වාසි **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(v) (අ) 'මෙහෙයුම් පෙර වියදම' යන්න නිර්වචනය කර, උදාහරණ **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ආ) ව්‍යාපාරයක් මෙහෙයුම් පෙර වියදම් අඩුවෙන් ඇස්තමේන්තු කිරීම තුළින් අත්වන ප්‍රතිවිපාක **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(මුළු ලකුණු 20 යි)

WWW.PastPapers.WiKi

* * *

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library